ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව
උපාධි වැඩසටහන -2023/2024
5 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2024
**SNU5336/ESU3136 - විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ දාර්ශනික පදනම**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2025.01.18 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

<u>01 - වන කොටස</u>

01. අන්තර්කරණ අධ්‍යාපන පරිචය තුළ නැගී එන සංකල්ප තුනක් (03) හඳුනාගෙන, ඉන් එක් සංකල්පයක් උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

02. අන්තර්කරණ පන්තිකාමර ගුරුවරුන් සඳහා අධ්‍යාපන දර්ශනය වැදගත් වන හේතු පහක් (05) ලැයිස්තුගත කරන්න.

03. ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමය තුළදී, ආබාධ සහිත සිසුන් සඳහා පහත සඳහන් ඒවායේ වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න.
   a. විශේෂ පාසල්
   b. විශේෂ අධ්‍යාපන ඒකක
   c. අන්තර්කරණ අධ්‍යාපනය

04. අදාළ උදාහරණ ගෙනහැර දක්වමින් අධ්‍යාපනයේ ප්‍රධාන කාර්යයන් විවිධ දෘෂ්ටිකෝණ ඇසුරින් පැහැදිලි කරන්න.

05. ශ්‍රී ලංකාවේ ආබාධ සහිත දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේදී මහත්මා ගාන්ධිතුමාගේ මූලධර්ම යොදාගත හැකි ආකාරය උදාහරණ දක්වමින් විස්තර කරන්න.

06. ජීන් ජැක් රූසෝ (Jean – Jacques Rousseau) විසින් යෝජනා කරන ලද මූලධර්ම තුනක් (03) නම් කොට, අන්තර්කරණ පන්තිකාමර ගුරුවරුන්ට මෙම මූලධර්ම උපකාර විය හැකි ආකාරය සාකච්ඡා කරන්න.

07. සාරධර්ම අධ්‍යාපනය, විශේෂ අධ්‍යාපන ඒකක තුළ හඳුන්වාදීමේදී මුහුණ දෙන අභියෝග පහක් (05) හඳුනාගන්න.

08. ශ්‍රී ලංකාවේ වත්මන් අධ්‍යාපන ක්‍රමය තුළ අන්තර්කරණ අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීමට බාධා කරන අභියෝග පහක් (05) කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 05x08=40)

## 02- කොටස

09. (i.) ශ්‍රී ලංකාවේ ඒකීකරණ අධ්‍යාපන ක්‍රමය තුළ "ඉඩ සලසා" ඇති සිසුන් කාණ්ඩ විස්තර කරන්න. (ලකුණු 04)

(ii.) රාඕ සහ පිරිස ඉදිරිපත් කරන ලද විශේෂ අවශ්‍යතා අධ්‍යාපනයේ මූලධර්ම හත (07) උදාහරණ දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 06)

(iii.) රාඕ සහ පිරිස, ඉදිරිපත් කළ ඉහත මූලධර්ම හත (07) ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ හඳුන්වාදීමේදී මුහුණ දිය හැකි අභියෝග සාකච්චා කරන්න.

(ලකුණු 10)

10. (i.) ජෝන් ඩුවී (John Dewey) ගේ අධ්‍යාපන දර්ශනයේ ඇති ප්‍රධාන මූලධර්ම විස්තර කරන්න. (ලකුණු 05)

(ii.) ආබාධ සහිත දරුවන්ගේ ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේදී මෙම මූලධර්ම සහාය කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(iii.) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයෙකු වශයෙන් ඩුවීගේ මූලධර්ම ක්‍රියාත්මක කිරීමේදී ඔබ මුහුණ දිය හැකි අභියෝග විමසන්න. ඔබගේ පිළිතුරු තහවුරු කිරීමට උදාහරණ ඉදිරිපත් කරන්න.

(ලකුණු 09)

11. (i.) ආබාධ සහිත දරුවන්ට ඉගැන්වීමේදී අධ්‍යාපනික දර්ශන සුවිශේෂී වන්නේ ඇයිද යන්න සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ii.) මූලික අධ්‍යාපන මූලධර්මයන් ලෙස ටොමසෙව්ස්කි (Tomaszewski) විසින් හඳුන්වා දුන් අයිතිවාසිකම් පාදක ප්‍රවේශයන් තුනක් (03) විස්තර කරන්න.

(ලකුණු 06)

(iii.) "අන්තර්කරණය යනු ස්ථානයක් හෝ වැඩසටහනක් නොව සංකල්පයකි." මෙම ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කර ඔබගේ පිළිතුර තහවුරු කිරීමට උදාහරණ ගෙනහැර දක්වන්න.

(ලකුණු 09)

12. (i.) ප්ලේටෝ විසින් හඳුන්වාදුන් අධ්‍යාපනික වැඩසටහන, එහි මූලික මූලධර්මයන් ඉස්මතු කරමින් විස්තර කරන්න.

(ලකුණු 05)

(ii.) ප්ලේටෝගේ එම අධ්‍යාපනික වැඩසටහනෙහි මූලධර්ම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රමය තුළ අබාධ සහිත දරුවන්ගේ අධ්‍යාපනයට සහාය වීමට අනුගත කරගත හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 07)



16

(iii.) ශ්‍රී ලංකාවේ ආබාධ සහිත සිසුන් සවිබල ගැන්වීමේදී යාවජීව අධ්‍යාපනයේ වැදගත්කම උදාහරණ ගෙනහැර දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 08)

13. (i.) ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා අවිධිමත් අධ්‍යාපනයේ වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 05)

(ii.) මහත්මා ගාන්ධි සහ කාල් මාක්ස් විසින් යෝජනා කළ වෘත්තීය අධ්‍යාපන මූලධර්ම, විශේෂයෙන්ම අබාධ සහිත දරුවන්ට සම්බන්ධ කළ හැක්කේ කෙසේදැයි සසඳන්න.

(ලකුණු 07)

(iii.) ඵලදායි වෘත්තීය අධ්‍යාපන භාවිතාවන් ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙන ප්‍රධාන අභියෝග හඳුනාගෙන විස්තර කරන්න.

(ලකුණු 07)

14. (i.) සාරධර්ම අධ්‍යාපනය යන සංකල්පය පැහැදිලි කර ඔබේ පැහැදිලි කිරීම තහවුරු කිරීම සඳහා උදාහරණ ගෙනහැර දක්වන්න.

(ලකුණු 05)

(ii.) විශේෂ අවශ්‍යතා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළදී සාරධර්ම අධ්‍යාපනයේ වැදගත්කම සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) අන්තර්කරණ පන්තිකාමර ගුරුවරයකු ලෙස අන්තර්කරණ අධ්‍යාපනයේ ප්‍රධාන පාර්ශවකරුවන් අතර, සාරධර්ම අධ්‍යාපනය ප්‍රවර්ධනය කිරීමට ඔබ ගන්නා උපාය මාර්ග ගෙනහැර දක්වන්න.

(ලකුණු 08)

-සියලුම හිමිකම් ඇවිරිණි.-



17